**වෙරුගල් ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ එහි කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වෙරුගල් ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට වෙරුගල් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නැත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳව විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු 09 කට අදාළ පොලී ආදායම් රු.52,766 ක් වැඩියෙන් දක්වා තිබුණි. | මෙම වෙනස ඉදිරි මූල්‍ය වර්ෂයේදි නිවැරදි කරන බව. | ගිණුම් නිවැරදි කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු උසාවි දඩ ගාස්තු රු.824,831ක් වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | මෙම වටිනාකම ඉදිරි මූල්‍ය වර්ෂයේදි නිවැරදි කරන බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ රු.108,370 කට වෙන්දේසියේ විකුණා තිබූ උපකරණ, ලී බඩු හා සවිකිරීම් අයිතම 07ක පිරිවැය හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදු කර නොතිබුණි. | එම භාණ්ඩවල පිරිවැය අගය ඉදිරි මූල්‍ය වර්ෂය සඳහා ගිණුම් සැකසීමේදී නිවැරදි කෙරේ. | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය සඳහා ලැබිය යුතු වැටුප් සහ සභික දීමනා රු.1,544,355 ක් ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි මූල්‍ය වර්ෂය සඳහා ගිණුම් සැකසීමේදී නිවැරදි කෙරේ. | ලැබිය යුතු ලෙස දැක්වීමට පියවර ගත යුතුය. |
| (ඉ) | පළාත් පාලන දෙපාර්තමේන්තුව, සහකාර පළාත් පාලන කොමසාරිස් සහ නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග කළ එකතුව රු.1,063,003 ක් වූ භාණ්ඩවල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි මූල්‍ය වර්ෂය සඳහා ගිණුම් සැකසීමේදී නිවැරදි කෙරේ. | ගිණුම් නිවැරදි කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ සභාව විසින් රු.7,093,806ක වියදමින් ඉදිකළ පොදු සේවා මණ්ඩපයේ වටිනාකම ප්‍රාග්ධනීත කර නොතිබුණි. | ඉදිකිරීම් සම්පූර්ණ කළ පසු ගිණුම්ගත කරන බව. | -එම- |
| (උ) | සමාලෝචිත වර්ෂයේ හිඟ කඩ කුලී රු.347,903 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි මූල්‍ය වර්ෂය සඳහා ගිණුම් සැකසීමේදී නිවැරදි කරන බව. | -එම- |

**1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.58,903,932 ක ඉඩම් හා ගොඩනැගිලිවලට අදාළ හිමිකම් ඔප්පු හා ස්ථාවර වත්කම් ලේඛනය විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු. 58,903,932ක් සඳහා හිමිකම් ඔප්පු හා ඉඩම් ලිපිලේඛන සභාව සතුව වර්තමානයේ නොමැත. එසේ වුවත්, ඒවා ලබාගැනීමේ මූලික පියවර සභාව විසින් ගෙන ඇති බව. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති සෑම කරුණක් සඳහාම සාක්ෂි ආධාර ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුය. |

## 1.7 අනුකූල නොවීම

### 1.7.1 නීති, රීති ,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති ,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවූ අවස්ථාවන් පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි අංක 571 | රු.244,352 ක කල් ඉකුත්වූ තැනපතු නියාදනය කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි අංක 371 | 2008 සිට 2019 දක්වා කාලපරිච්ඡේදයට අදාලව ගෙන තිබුණු රු.625,999ක අත්තිකාරම් නිරවුල් කර නොතිබුණි. | නිරවුල් නොකළ අත්තිකාරම් මූල්‍ය රීති ප්‍රකාරව ක්‍රියාමාර්ග ගෙන කපාහැරීමට හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | අත්තිකාරම් නිරවුල් කළ යුතුය. |

### 1.7.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේ පළාත් නිෂ්චිත සංවර්ධන මූල්‍ය (PSDG) ව්‍යාපෘතිය යටතේ මාවඩිසේනෙයි පාසැල් මාර්ගය ප්‍රතිසංස්කරණ කාර්යයේ ගෙවිය යුතු VAT රු. 114,852ක් මේ දක්වා ගෙවා නිරවුල් කර නොතිබුණි. | එම මුදල් මූල්‍ය ක්‍රියාපටිපාටි අනුගමනය කර ආදායමට මාරුකිරීමට කටයුතු කරන බව. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.631,836ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 1,060,101ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. "000" | රු. "000" | රු. "000" | රු. "000" | රු. "000" | රු. "000" | රු. "000" | රු. "000" |
| i) | වරිපනම් හා බදු | 2 | -- | -- | -- | 2 | -- | -- | -- |
| ii) | කුලී | 817 | 2,053 | 1,055 | 998 | 1,590 | 1,590 | 1,378 | 212 |
| iii) | බලපත්‍ර ගාස්තු | 407 | 231 | 231 | -- | 348 | 272 | 272 | -- |
| iv) | වෙනත් ආදායම් | 1,522 | 1,698 | 1,698 | -- | 1,008 | 320 | 320 | -- |
| | එකතුව | 2,748 | 3,982 | 2,984 | 998 | 2,948 | 2,182 | 1,970 | 212 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කුලි | | |
| i) වසර 03 කට අධික කාලයක සිට පැවත එන එකතුව රු.725,254 ක් වූ කඩකාමර හිඟකුලි, පානීය ජලය බෙදාහැරීමේ ගාස්තු සහ යන්ත්‍ර හිඟකුලි අදාල පුද්ගලයින් හඳුනාගත නොහැකිවීම හේතුවෙන් අයකර ගත නොහැකි වී පැවතුණි. | අදාල පුද්ගලයින් හා ඒ සම්බන්ධ ලියකියවිලි හඳුනාගෙන නියමිත මූල්‍ය ක්‍රියාපටිපාටින් අනුගමනය කර කඩිනමින් පියවර ගන්නා බව. | හිඟ මුදල් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| ii) සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ හිටි කුලී ශේෂය රු.1,210,000 ක් විය. | එම මූල්‍ය අඩුපාඩුව සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ඉදිරි වර්ෂයේ සකස් කෙරෙන මූල්‍ය වර්ෂයේ ගැළපීම් සිදු කරන බව. | -එම- |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) පවරා නොගත් වත්කම්** | | |
| වාහන 11ක් වර්ෂ 02 සිට 15ක් දක්වා සභාව විසින් පරිහරණය කර තිබුණද සභාවේ නමට පවරා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | එම වාහන සභාවට පවරා ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගන්නා බව. | වාහන සභාවේ නමට පවරා ගැනීමට පියවර ගත යුතුය. |

**(ආ) නිෂ්කාර්ය වත්කම්**

| | | | |
|---|---|---|---|
| (i) | ශ්‍රී ලංකා වරාය මෝයකට ප්‍රදේශයේ පිහිටි රු. 1,483,472ක් පිරිවැය වූ ICE කර්මාන්තශාලා ගොඩනැගිල්ල 2004 වර්ෂයේ සිට නියමිත අරමුණු සඳහා උපයෝජනය නොකර නිෂ්කාර්යව පැවැතුණි. | ධීවරයින්ගේ සුභසාධනය පිණිස තේ පැන්හලකට ලබාදීම සම්බන්ධයෙන් සාකච්ඡා සිදු කරන බව. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | සභාවේ පැවැති ට්‍රැක්ටර් 04ක්, වතුර බවුසරයක් වර්ෂ 01 සිට 04ක් දක්වා කාලයක් අළුත්වැඩියා නොකර නිෂ්කාර්යව පැවැතුණි. | ප්‍රමාණවත් අරමුදල් නොමැති වීම හේතුවෙන් අළුත්වැඩියා නොකරන ලද බව. | දෝෂ සහිත වාහන අළුත්වැඩියා කිරීමට හෝ සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගත යුතුය. |
| (iii) | සභාවට අයත් ගොඩබසින ස්ථාන 04ක් පැවැති නමුත් ගොඩබැසීමේ ස්ථාන 02ක් භාවිතා නොකිරීම හේතුවෙන් මහජනතාව මහත් දුෂ්කරතාවන්ට මුහුණපා තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. එම ගොඩබැසීමේ ස්ථාන අළුත්වැඩියා කර භාවිතා කිරීමට කළමනාකරණය විසින් පියවර ගෙන නොතිබුණි. | මෙම ගොඩබැසීමේ ස්ථාන 03ක් අළුත්වැඩියා කිරීමට පළාත් පාලන කොමසාරිස්වරයාට ඇස්තමේන්තු වාර්තා යවා ඇති අතර රාජ්‍ය නොවන සංවිධානයක සහාය සහිතව නව මගක් ලබාගැනීමට කටයුතු කරමින් පවතින බව. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සභාව විසින් අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර තිබුණත් විගණන කටයුතු කිසිවක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණන කටයුතු නියමිත කාලපරිච්ඡේදයේ ක්‍රියාත්මක කර වාර්තා ඉදිරිපත් කරන ලෙසට අදාල නිලධාරීට දන්වා ඇති බව. | අභ්‍යන්තර විගණක විසින් විගණන කටයුතු සිදු කළ යුතුය. |

**4.3 තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අප්‍රේල් 23 දිනැති අංක වි.ලේ.පොදු/2018/61 දරන චක්‍රලේඛය ප්‍රකාරව 2030 වර්ෂයේ ළඟාකර ගතයුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සභාව විසින් පිළියෙල කර නොතිබුණි. | 2030 වර්ෂයේ තිරසාර සංවර්ධනය පිළිබඳ න්‍යාය පත්‍රය පිළියෙල කිරීමට කටයුතු කරන බව. | තිරසාර සංවර්ධනය පිළිබඳ න්‍යාය පත්‍රය පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |